**මාතලේ මහා නගර සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**
**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 18 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3.3 හා 1.3.6යන ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණු එකතු කළ අගය මත බදු, මුද්දර බදු හා ජාතිය ගොඩනැගීමේ බදු එකතුව රු. 992,387ක් ගිණුම් වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ). 1995 සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු එකතුව රු.270,838ක් වූ දේපල ණය පොලී, අභ්‍යාසලාභී දීමනා, හිඟ වැටුප් හා තාවකාලික විශ්‍රාම වැටුප් පෙර ගෙවුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ). ඉකුත් වර්ෂයට අදාල රු.149,800ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ විෂයයන් 05ක් හා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 18 කදී මිලදී ගෙන තිබුණු රු.646,749ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විෂයන් 13 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට භෞතිකව නොතිබුණු පිරිවැය රු.605,500ක් වූ ඩොල්ෆින් වෑන් රථයේ වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.4 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.16,293,153ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, එකතුව රු. 229,901ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්.

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 5ක වටිනාකම රු.62,775,839ක් වූ අතර, වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ රු.6,244,360ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයහිමි ශේෂ වල එකතුව රු.65,956,415ක් වූ අතර වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.40,993,675ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). එකතුව රු.16,027,967ක් වූ ණයගැති විෂයයන් 02ක්, රු.10,747,587ක් වූ ණයහිමි ශේෂයන් ,රු.9,442,248 ක්වූ ගෙවිය යුතු තැන්පතු ශේෂයන්, රු.545,237 ක්වූ තොග ඌනතා ශේෂයන් , රු. 287,186 ක් වූ ස්ථාවර තැන්පතු ශේෂ 04 ක් ,එකතුව රු. 5,236,521 ක්වූ තොගයක්, රු.1,503,892ක් වූ පුස්තකාල පොත්, රු.140,400 ක් වූ දුම්රිය දෙපාර්තමේන්තුවේ තැන්පතු , රු. 38,911ක් වූ සේවක ඇප හා රු.26,549ක් වූ සරප් වංචා කල මුදල් සම්බන්ධයෙන් තහවුරු කෙරෙන ලේඛනගත සාක්ෂි වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා ,අදාල ලේඛන හා උපලේඛන , ශේෂ තහවුරු කිරීමේ ලිපි හා මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරීක්ෂණ වාර්තා ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී එම විෂයයන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකිය.

1.3.7 නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ වලට යොමුව | අනුකූල නොවීම. |
| --- | --- |
| (අ) මහා නගර සභා ආඥා පනතේ 228 වගන්තිය හා මහා නගර සභා අතුරු ව්‍යවස්ථා කොටස | මහා නගර සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට යොදවා නොගෙන අවිධිමත් පරිදි එක්ස්කැවේටර් යන්ත්‍රයක් සේවයේ යොදවාගෙන සභා අරමුදලින් රු.1,427,370 ක කුලී ගෙවා තිබුණි. |
| (ආ) 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා. (V (ඇ)- කොටස) | යොමුගත නියමයන් පරිදි කටයුතු නොකර, අත් මිල ගණන් මත සැපයුම්කරුවෙකු තෝරාගෙන රු.268,750ක් ගෙවා, පාලම් කොඩි 125ක් මිලදී ගෙන තිබුණි. |
| (ඇ) 2013 මැයි මස 08 දිනැතිඅංක: සිපීසී/සීඑම්සී/01/06/01 /4-7දරන මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපිය | යොමුගත විධිවිධානවලට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව නාගරික මන්ත්‍රිවරුන්ට මහා සභා රැස්වීම්වලට සහභාගි වීම වෙනුවෙන් රු.94,000ක දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) 2000 නොවැම්බර් මස දින රහිත අංක 7/1/2000 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී නාගරික ලේකම් වරයාට සමාලෝචිත වර්ෂය තුළ රු.66,061ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,773,038ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,915,559ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,857,479ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක කාලපරිච්ඡේදය තුල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඒ ඒ වර්ෂයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරේ.

(ආ) මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත්විට, වියදම් වැඩි වීමේ අනුපාතය අඛණ්ඩව ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) කාරක ප්‍රාග්ධනය සැලකූ විට එය ක්‍රමයෙන් අඩු වී සමාලෝචිත වර්ෂයේදී රු.24,833,163ක ඌන කාරක ප්‍රාග්ධන තත්ත්වයක් බවට පත්වී තිබුණි.

2. 3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 වරිපනම් බදු
-------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.21,738,580ක් වූ අතර වසරකට පෙර සිට ඉදිරියට එන රු.8,973,463 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

2.3.2 ජල ගාස්තු
-------------

2004 වර්ෂයේදී ජල සැපයුම ජාතික ජල සම්පත් මණ්ඩලයට පවරන අවස්ථාවේදි අයකර ගැනිමට තිබුණු රු.4,802,812ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

2.3. 3 බදු කුලී
---------

සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟහිටි බදුකුලී ශේෂය රු. 3,399,832ක් වු අතර වසර 05 ක කාලයකට පෙර සිට ඉදිරියට එන රු.624,442ක ශේෂයක්ද ඊට ඇතුළත් වී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 2,566,773 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,257,107ක් අයවිය යුතුව තිබුණි.

2.3.5 අධිභාර
---------

මහා නගර සභා ආඥා පනත ( 252 වන අධිකාරය) යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ අධිභාරවල වටිනාකම රු.45,861 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 541/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ (ආ) කොටසේ පළ කළ සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ III වැනි කොටසේ 13 ඡේදය අනුව මහා නගර සභාවේ ස්වාධීන අඛණ්ඩ අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යා යුතු වුවත්, ඊට අනුකූල වී නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 134(2) අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන්ද පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය

(අ) මහා නගර සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය සේවකයින් 131 දෙනෙකුගෙන් අයවිය යුතු රු.775,005ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදි කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තියේ විධිවිධාන හා බදුකරුවන් සමඟ එළඹ තිබූ බදු ගිවිසුම්වල කොන්දේසි වලට අනුකූලනොවී සභාව සතු නිවාස හයක ගිවිසුම් ගත කාල සීමාව ඉක්මවා වසර එකේ සිට වසර පහ දක්වා කාලයක් පදිංචි වී තිබුණි.

(ඇ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව, ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ ලැබී තිබුණු අයදුම්පත් 481 කින් 324ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 27 ක් සඳහා පමණි.

(ඈ) මහා නගර සභාවේ සේවය කළ නිලධාරින් 16 දෙනෙකු වෙත 1999 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 34 කදී ලබා දී තිබු රු.635,965 ක අත්තිකාරම් මුදල් නිරවුල් කර නොතිබුණි.

(ඉ) 1994 වර්ෂයේ සිට 2007 දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 17 ක දී බාහිර පාර්ශවයන් වෙත විවිධ කාර්යයන් වෙනුවෙන් ලබා දී තිබූ රු.295,671ක අත්තිකාරම් මුදල් නිරවුල් කරගෙන නොතිබුණි.

(ඊ) බලපත්‍ර නිකුත් කළ යුතු වෙළඳසැල් 711 ක් හඳුනාගෙන ගාස්තු අයකර ගෙන තිබුණද, ඉන් වෙළඳසැල් 208ක් සඳහා පමණක් බලපත්‍ර ලබා දී තිබුණි. ඒ අනුව බලපත්‍ර ලබා නොගත් වෙළඳසැල් 503ක් ව්‍යාපාර කටයුතු කර තිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
-----------------------------------
සභාවට අයත්ව තිබුණු දිය බුබුලේ පිහිටි ඉඩම නව පොලිස් ගොඩනැගිලි සංකිර්ණයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද, ඒ වෙනුවට මහා නගර සභාවට පවරා ගත යුතු ඉඩම් දෙකක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 හඳුනාගත් අලාභ
------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරනයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5:4 ඡේදය ප්‍රකාරව කටයුතු නොකිරිම නිසා මහා නගර සභා ලේකම්වරයාගෙන් 2010 අප්‍රේල් සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් දක්වා රු.62,380ක් අඩුවෙන් නිවාස කුලී අයකර තිබුණි.

(ආ). පැරණි පොලීසිය පිහිටි ඉඩම මහ නගර සභාවට නැවත ලබා ගැනීම සඳහා එම ඉඩමෙහි පිහිටි පොලිස් නිවාසවල පදිංචි වී සිටි පොලිස් නිලධාරීන් සඳහා මහා නගර සභා අරමුදලින් රු.510,000 ක් වැයකර කුලී පදනම මත පෞද්ගලික නිවාස 04 ක් ලබාදී තිබුණද, ඔවුන් එම නිවාසවල පදිංචිය ආරම්භ කර නොතිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

එකතු වටිනාකම රු. 5,552,191ක වත්කම් ඒකක 14ක් සහ වටිනාකම ගණනය කර නොමැති වත්කම් ඒකක 12ක් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති අතර,මහා නගර සභාව සතු නිල නිවාස 2 ක් ද නිශ්කාර්යව පැවතුණි.

## 3.6 ආර්ථික නොවූ ගනුදෙනු

මාතලේ මහ නගර සභාවේ නිලධාරීන් හා සේවකයින්ට බෙදා දීම සඳහා 2012 වර්ෂයේ රු.250,454 ක් ගෙවා මිලදී ගෙන තිබුණු නිල ඇඳුම් රෙදි ඒවා අදාළ අයවෙත, නිකුත් නොකිරීම නිසා රු.157,500 ක වටිනාකම ඇති රෙදි මීටර් 375 ක් 2014 අගෝස්තු 25 දින වන විටත් ගබඩාවේ ඉතිරි වී තිබුණි.

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

2013 මහ නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ ඉටු කරන ලද කර්මාන්ත පිළිබඳව 2014 සැප්තැම්බර් 18 දින කරන ලද ස්ථානිය පරික්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරික්ෂණය විය.

| | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල<br>රු. | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ). | මාතලේ නාගොල්ල පාර කාර්මික විද්‍යාලය අසලින් යන මාර්ගයේ කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කිරීම | 1,198,696 | වර්ග මීටර 475 ක ගල්කුඩු අතුරා කොන්ක්‍රීට් කැටගල් ඇතිරීම වෙනුවෙන් ගෙවීම් කර ඇතත්, වර්ග මීටර 471 ක් පමණක් නිම කර තිබුණු බැවින් වර්ග මීටර් 04 ක් සඳහා රු.8,020 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ). | මල්වත්ත පාර 4 වන පටුමඟ කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කිරිම. | 600,173 | වර්ග මීටර් 238 ක් සඳහා ගෙවීම් කර ඇතත්, වර්ග මීටර් 232 ක් පමණක් නිමකර තිබූ බැවින්, වර්ග මීටර් 6 ක් සඳහා රු. 12,030 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ). | රජවීදියේ සිට මහ දෙවට පටුමඟ දක්වා මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 501,009 | වර්ග මීටර් 240 ක් සඳහා ගෙවීම් කර ඇතත්, වර්ග මීටර් 218 ක් පමණක් නිමකර තිබූ බැවින්, වර්ග මීටර් 22 ක් සඳහා රු.44,110 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ). | දේවාල පාර කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 601,507 | වර්ග මීටර් රු.238 ක කැටගල් ඇතිරීම සඳහා ගෙවීම් කර ඇතත්, වර්ග මීටර් 175 ක් පමණක් කැටගල් අතුරා තිබූ බැවින්, වර්ග මීටර් 63 ක් සඳහා රු.126,315 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඉ). | මාතලේ හරස්ගම පාර රිවඩ් පමුණුව මාවත අතුරු මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 575,237 | වර්ග මීටර් 240 ක කැටගල් ඇතිරීම වෙනුවෙන් ගෙවීම් කර ඇතත්, වර්ග මීටර් 232 ක් පමණක් නිමකර තිබූ බැවින්, වර්ග මීටර් 08 ක් සඳහා රු.16,040 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ). | හුසේන් පටුමඟ - 1 ඩොලේ පොදු ළිඳ අසල සිට ඉදිරියට මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 656,670 | වර්ග මීටර් 250 ක කැටගල් ඇතිරීම සඳහා ගෙවීම් කර ඇතත්, මාර්ගය වර්ග මීටර් 242.55 ක් වූයෙන් වර්ග මීටර් 7.45 ක කැටගල් ඇතිරීම සඳහා රු.14,937 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ). | හුසේන් පටුමඟ -1 දුම්රිය ස්ථානයේ පිටුපස සිට ඉදිරියට මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 648,241 | වර්ග මීටර් 245 ක කැටගල් ඇතිරීම සඳහා ගෙවීම කර ඇතත්, වර්ග මීටර් 218 ක් පමණක් නිමකර තිබූ බැවින්, වර්ග මීටර් 27 ක් සඳහා රු.54,135 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ගොඩනැගිල්ල පොහොර නිෂ්පාදනය සඳහා අවුරුදු 30කට පෞද්ගලික ආයතනයකට පවරා, දිනකට කසළ ටොන් 1.5 ක් පමණ නගර සභාවෙන් ප්‍රවාහනය කර, මහා නගර සභාවේ කම්කරුවෙකු පූර්ණකාලීනව එහි සේවයේ යොදවා 2010 දෙසැම්බර් මස සිට පොහොර නිෂ්පාදන අලෙවියෙන් පෞද්ගලික සමාගම ආදායම් උපයාගෙන තිබුණද, මහා නගර සභාවට කිසිදු ආදායමක් හිමි වී නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී තායිලන්තයේ "ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි "නැමති උසස් අධ්‍යාපන ආයතනයෙන් බිලාන් කාබන් ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.704,539ක මූල්‍යාධාර වලින් රු.425,000ක මුදලක් පමණක් අදාල ව්‍යාපෘතිය සඳහා වැය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි.

3.9 පාරිසරික ගැටළු

-------------------

මාතලේ මහ නගර සභා සීමාව රෝග බෝවීමේ ප්‍රවණතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර, සෞඛ්‍ය අංශයේ පවත්වාගෙන යනු ලබන බෝවෙන රෝග විස්තර ඇතුලත් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 02 තුළ පිළිවෙලින් 21 ක්, 70 ක් සහ 48ක් වශයෙන් ඩෙංගු රෝගීන් හඳුනාගෙන තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 48 ක් සඳහා සලසා දී තිබූ රු.6,746,800 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයන්ට මාරු කිරීමත් වෙනත් වැය විෂයයන් 105 ක ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර සියයට 10.7 සිට සියයට 98.8 දක්වා පරාසයක විචලනයන් පැවතීමත්, ආදායම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර සියයට 73 සිට සියයට 100 අතර පරාසයක විචලනයන් පැවතීමත් , තවත් ආදායම් විෂයයන් 4 ක ඇස්තමේන්තුගත ආදායම් වලින් කිසිදු මුදලක් උපයාගෙන නොතිබීමත් නිසා අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්

--------------------------------------------------------

සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම් වලින් විමසුම් 10කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.21,706,937 ක් විය.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) . ගිණුම්කරණය
(ආ). ආදායම් පාලනය.
(ඇ). අයවැය පාලනය.
(ඈ). වත්කම් කළමනාකරණය.
(ඉ) . ණයගැති හා ණය හිමි පාලනය.
(ඊ) . ගබඩා පාලනය